2026.10.25

## ගලගොඩඅත්තේ ඥාණසාර ස්ථවිර වෙත ජනාධිපති සමාව ප්‍රදානය කරන ලෙස ඉල්ලා සිටිමින් විරෝධතාවල නිරත මහා සංඝරත්නය වෙත ශාසනාලයෙන් සිදුකෙරන කාරුණික දැනුම්දීමයි

ශ්‍රී ලංකාවේ ඓතිහාසික, ආගමික හා සමාජයීය සන්දර්භය තුළ භික්ෂූන් වහන්සේ යනු ජනතාවගේ පරම ගෞරවාදරයට හා පූජෝපහාරයට පාත්‍ර වන ආධ්‍යාත්මික මාර්ගෝපදේශකයාණන් වහන්සේය. එම අද්විතීය ගෞරවය හා පිළිගැනීම සුරැකී පවතින්නේ භික්ෂුත්වයට ආවේණික වූ සංවරශීලී පැවිදි ප්‍රතිපදාව සහ සම්බුද්ධ විනය ආරක්ෂා වන තාක් කල් පමණි.

එබැවින්, වර්තමානයේ උද්ගතව ඇති සංවේදී වාතාවරණය හමුවේ ගලගොඩඅත්තේ ඥාණසාර ස්ථවිර සම්බන්ධ උක්ත ගැටලුව නීත්‍යානුකූල හා සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමට ත්‍රෛනිකායික මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ලෙස අපි රජය වෙත අවශ්‍ය මැදිහත්වීම සිදු කර ඇත්තෙමු.

දැනට මෙම සිදුවීම සම්න්ධයෙන් සිදුකරන ඇතැම් විරෝධතා දැක්වීම් පාදක කරගනිමින් ශ්‍රී ලාංකේය සමාජය තුළත්, ජාත්‍යන්තරය හමුවේත් භික්ෂූන් වහන්සේ කෙරෙහි පවතින උත්තරීතර ගෞරවය හා කීර්තිනාමය පළුදු කිරීමට ඇතැම් පිරිස් කටයුතු කරන අතර ඒ සඳහා ඉඩ නොතැබීමට සමස්ත භික්ෂුන් වහන්සේලා කටයුතු කළ යුතුය.

තව ද, කිනම් අර්බුදයක් හමුවේ වුව ද ශාසනික විනය හා සංඝ සාමග්‍රිය ආරක්ෂා කරමින්, එකී අර්බුද ධර්මානුකූලව හා විනයානුකූලව නිරාකරණය කර ගැනීමට කටයුතු කිරීම මහා සංඝරත්නය ලෙස අපගේ පරම වගකීම විය යුතු බව දන්වා සිටිනු කැමැත්තෙමු.

එහෙයින් ශාසන බ්‍රහ්මචර්යාවේ උදාර අරමුණත් ඓතිහාසික භික්ෂු භූමිකාවේ සාමාජීය කර්යභාරයත් නිරන්තරයෙන් මෙනෙහි කරමින් **"අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භියොභාවය"** යන සම්බුද්ධෝපදේශය මත පිහිටා මහජන ප්‍රසාදය වඩා වර්ධනය වන ආකාරයෙන් කටයුතු කරන මෙන් සියලු නිකාය පාර්ශ්වයන්හි සමස්ත මහා සංඝරත්නයට මෙයින් සිහිපත් කර සිටිම්හ.

ඒ වගත් මෙසේ ම,

අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ
මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහානායක ස්ථවිර,
මල්වතු මහාවිහාරය, මහනුවර.

අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී
පඤ්ඤානන්ද ඥාණරතනාභිධාන
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ
අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ මහානායක ස්ථවිර,
අස්ගිරි මහාවිහාරය, මහනුවර.

අතිපූජ්‍ය කරගොඩඋයන්ගොඩ මෛත්‍රී මූර්ති අභිධාන
ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ උත්තරීතර මහානායක
ස්ථවිර, ශ්‍රී ධම්මානන්ද විද්‍යායතන පිරිවෙන,
මිරිස්වත්ත, බළංගොඩ.

අතිපූජ්‍ය මකුලෑවේ ශ්‍රී විමලාභිධාන
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකායේ මහානායක ස්ථවිර,
මිණිඔළුව විද්‍යාවාස මහ පිරිවෙණ,
මීරිගම.